# මාසික වෙළඳ විවරණිකාව


ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

2020 මැයි

වෙළුම 02 නිකුතුව 05


## විශේෂ සිදුවීම්





2020 වසරේ මැයි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 587ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 39.0කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

2020 වසරේ මැයි මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 994ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 44.3කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.





2020 වසරේ පළමු මාස පහ තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 28.4කින් පහළ ගිය අතර, ආනයන වියදම ද සියයට 19.2කින් පහළ ගියේය.


වෙළඳ හිඟය 2019 මැයි මාසයේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 823ට සාපේක්ෂව 2020 මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 407 දක්වා අඩු විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2020 ජන. - මැයි)




# අපනයන ක්‍රියාකාරිත්වය

අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - මැයි)




අපනයන පරිමා දර්ශකය - (ජන. - මැයි)





සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු මාස පහ තුළ දී අපනයන ආදායම පහත වැටුණි.


සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමා පහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු මාස පහ තුළ දී අපනයන පරිමා දර්ශකය පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


කෘෂිකාර්මික අපනයන ආදායම





කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශක සහ මිල දර්ශක




කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - මැයි)




තේ සහ රබර් මිල ගණන් *





*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වේ


2020 වසරේ පළමු මාස පහ තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණු අතර තේ, මුහුදු ආහාර, කුළුබඩු සහ පොල් අපනයන පහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.

# කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - මැයි)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2020 වසරේ පළමු මාස පහ තුළ දී කාර්මික අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම පහළ යෑම එයට හේතු විය.

# ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - මැයි)





### ආනයන පරිමා දර්ශකය (ජන. - මැයි)





2020 වසරේ පළමු මාස පහ තුළ දී ආනයන වියදම පහත වැටුණු අතර, සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පරිමා පහළ යෑම හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ආනයන පරිමා දර්ශකය පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - මැයි)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





2020 වසරේ පළමු මාස පහ තුළ දී විලවුන් වර්ග හා සේදුම් ද්‍රව්‍ය, විදුලි සංදේශ මෙවලම්, රෙදිපිළි හා උපාංග සහ රබර් නිෂ්පාදිත ඇතුළු ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය. ආහාර හා පාන වර්ග උප කාණ්ඩය යටතේ වර්ග කර ඇති පාන වර්ග, පලතුරු සහ මුහුදු ආහාර ආනයන වියදම ද පහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



### අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - මැයි)





### බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





ප්‍රධාන වශයෙන් ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ මූල ලෝහ ආනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු මාස පහ තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී තිරිඟු හා ඉරිඟු, සකස් නොකළ දුම්කොළ, ආහාර සැකසුම් සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය


### ආයෝජන භාණ්ඩ ආනයන වියදම




### ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - මැයි)




සියලු ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම හේතුවෙන් 2020 වසරේ පළමු මාස පහ තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | මැයි- 19 | මැයි - 20 | වෙනස (%) | ජන. - මැයි 2019 | ජන. - මැයි 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **215.9** | **183.0** | **-15.2** | **1,040.6** | **809.8** | **-22.2** |
| එයින් | තේ | 125.6 | 108.3 | -13.8 | 571.8 | 456.7 | -20.1 |
| | පොල් | 32.2 | 27.9 | -13.6 | 143.9 | 112.6 | -21.8 |
| | කුළුබඩු | 22.6 | 19.3 | -14.9 | 119.1 | 82.4 | -30.8 |
| | මුහුදු ආහාර | 18.6 | 11.5 | -38.0 | 122.2 | 74.8 | -38.8 |
| **කාර්මික අපනයන** | | **741.3** | **401.0** | **-45.9** | **3,853.2** | **2,695.8** | **-30.0** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 424.2 | 220.1 | -48.1 | 2,256.0 | 1,540.2 | -31.7 |
| | රබර් නිෂ්පාදිත | 77.2 | 49.4 | -36.1 | 363.1 | 269.7 | -25.7 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 39.5 | 10.6 | -73.1 | 206.4 | 202.8 | -1.8 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 37.2 | 29.3 | -21.3 | 202.3 | 156.1 | -22.8 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 38.1 | 20.8 | -45.3 | 172.2 | 116.3 | -32.5 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.8 | 6.8 | -72.4 | 131.1 | 61.6 | -53.0 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.4 | 2.6 | -68.8 | 49.2 | 20.2 | -58.8 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **3.8** | **2.7** | **-29.2** | **21.4** | **13.0** | **-39.5** |
| **මුළු අපනයන** | | **961.0** | **586.7** | **-39.0** | **4,915.3** | **3,518.7** | **-28.4** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | මැයි- 19 | මැයි - 20 | වෙනස (%) | ජන. - මැයි 2019 | ජන. - මැයි 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **332.5** | **264.4** | **-20.5** | **1,552.9** | **1,533.0** | **-1.3** |
| **ආහාර හා පාන වර්ග** | | 134.8 | 122.1 | -9.4 | 592.3 | 685.4 | 15.7 |
| එයින් | එළවළු | 25.5 | 30.3 | 18.8 | 118.1 | 175.9 | 49.0 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 197.7 | 142.3 | -28.0 | 960.7 | 847.6 | -11.8 |
| එයින් | පෞද්ගලික රථවාහන | 58.7 | 47.5 | -19.1 | 276.0 | 264.2 | -4.3 |
| **අන්තර් භාණ්ඩ** | | **1,047.0** | **486.3** | **-53.6** | **4,703.8** | **3,602.0** | **-23.4** |
| එයින් | ඉන්ධන | 402.8 | 62.9 | -84.4 | 1,716.4 | 1,133.0 | -34.0 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 260.6 | 121.0 | -53.6 | 1,168.2 | 889.9 | -23.8 |
| | පොහොර | 10.6 | 29.8 | 180.3 | 85.2 | 84.8 | -0.5 |
| | තිරිඟු හා ඉරිඟු | 23.9 | 39.8 | 66.8 | 110.7 | 128.7 | 16.3 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **404.1** | **243.1** | **-39.8** | **1,939.4** | **1,484.1** | **-23.5** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 206.8 | 158.1 | -23.6 | 1,055.6 | 843.6 | -20.1 |
| **මුළු ආනයන** | | **1,783.7** | **993.8** | **-44.3** | **8,196.2** | **6,619.1** | **-19.2** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | මැයි- 19 | මැයි - 20 | වෙනස (%) | ජන. - මැයි 2019 | ජන. - මැයි 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -822.7 | -407.1 | | -3,280.9 | -3,100.5 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (අ)

| කාණ්ඩය | | මැයි- 19 | මැයි - 20 | වෙනස (%) | ජන. - මැයි 2019 | ජන. - මැයි 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 133.8 | 81.7 | -39.0 | 136.8 | 98.3 | -28.1 |
| | පරිමා දර්ශකය | 167.4 | 89.0 | -46.8 | 149.2 | 107.0 | -28.3 |
| | මිල දර්ශකය | 79.9 | 91.7 | 14.8 | 91.7 | 91.9 | 0.2 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 159.6 | 88.7 | -44.4 | 146.7 | 118.5 | -19.3 |
| | පරිමා දර්ශකය | 172.9 | 101.0 | -41.6 | 160.5 | 139.5 | -13.0 |
| | මිල දර්ශකය | 92.3 | 87.9 | -4.8 | 91.4 | 84.9 | -7.1 |
| **වෙළඳ මිල අනුපාතය** | | 86.5 | 104.4 | 20.6 | 100.3 | 108.3 | 8.0 |

(අ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද